# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2112/42 – 2019 පෙබරවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා – 2019.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ, පුහුණු මධ්‍යස්ථානය, නේවාසිකාගාරය හා සංචාරක බංගලාව ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 පෙබරවාරි මස 15 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35 හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1425

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 525, කෝවිලමුදුන, ග්‍රාම නිලධාරි

කොට්ඨාසයේ, ගල්හින්න ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. ඕ. පෙරේරා මහතා විසින් මැන සකස් කරන ලද අංක 1918 දරන බලයලත් මිනින්දෝරු සැළැස්මේ කැබලි අක්ෂර ''සී'' වශයෙන් දක්වෙන ''කැප්පෙටිගල වත්ත'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි අක්කර 03 ක් පමණ වන ඉඩම් කොටස.

කැබලි අක්ෂර : 'සී'
ඉඩමේ නම : කැප්පෙටිගල වත්ත
මායිම් :

| | |
|---|---|
| උතුරට | : ජේ. ඉසාඩීන් මහතා, හිමිකම් කියන ඉඩම |
| නැගෙනහිරට | : පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය සහ ෆසීල් මහතා හිමිකම් කියන ඉඩම |
| දකුණට | : අසාම් මහතා සහ ෆසීල් මහතා හිමිකම් කියන ඉඩම් |
| බටහිරට | : අසාම් මහතා හිමිකම් කියන ඉඩම |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය:

1. අබ්දුල් සමාද් මහතා,
   අංක 114/1,
   හිල් ස්ට්‍රීට්,
   දෙහිවල.

03 – 768

---

## ශුද්ධි පත්‍රය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, 2017.11.06 දිනැති අංක 2044/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවේ අංක 11 - 941 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි ග්‍රාම නිලධාරි කොට්ඨාසය - අලවතුගොඩ යනුවෙන් සඳහන් වුවත්, එය ග්‍රාම නිලධාරි කොට්ඨාසය, අංක 585, බලකඩුව යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 පෙබරවාරි මස 15 වැනි දින,
අංක 35,
''ලක්දිය මැදුර', නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1316

03 – 769

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.